# NDDCB NEWSLETTER

**VOLUME : 35**

**January - March : 2023**

National Dangerous Drugs Control Board
Ministry of Public Security

## Vision

" Build a Drug Free Health and Secured Nation"

## දැක්ම

"මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

## Mission

"Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals"

## මෙහෙවර

"අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම"




**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
නො. 383,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**Tel – 011 2868794 – 6**
**Fax – 0112 868792 - 1**
**Email – mail@nddcb.gov.lk**
**Fb – National Dangerous Drug Control Board**

**<u>මගපෙන්වීම</u>**

- නීතීඥ ශාක්‍ය නානායක්කාර මහතා - සභාපතිනිය
- භද්‍රානි සේනානායක මහත්මිය අධ්‍යක්ෂ ජනරාල්
- තමර දර්ශන සහකාර - අධ්‍යක්ෂ පර්යේෂණ

**<u>සංස්කාරක මඩුල්ල</u>**

දිලිනි මධුශානි
තිළිණ ප්‍රියංකර

# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය......................

1984 අංක 11 දරණ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත යටතේ ස්ථාපනය කරන ලදි.

මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධ 1961, 1971 සහ 1988 ජාත්‍යන්තර සම්මුතීන් ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ ජාතික කේන්ද්‍රීය ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි.

## මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා නිවාරණ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සමීක්ෂණ සහ වෛද්‍ය, සමාජ, නෛතික, ආර්ථික සහ සංස්කෘතික කාරනා සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

මත්ද්‍රව්‍ය සම්න්ධයෙන් රසායනික විශ්ලේෂණ සිදු කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක නිර්දේශයන් ලබාදීම සහ පූර්ව රසායන ද්‍රව්‍ය පාලනය කිරීම.

මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

## මණ්ඩලය යටතේ ක්‍රියාත්මකවන ප්‍රධාන අංශ

- **පර්යේෂණ අංශය**
- **ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය (මධ්‍යස්ථාන 04)**
- **නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය**
- **ජාතික මාදක රසායනාගාරය**
- **බාහිර සේවා අංශය**
- **නමෝදිෂ්ට හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය**
- **පූර්ව රසායන අධිකාරිය**

# Special Events

## මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ටිරාන් අලස් මැතිතුමාගේ නිල සංචාරය

මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ටිරාන් අලස් මැතිතුමා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත 2023 ජනවාරි මස 20 වන දින නිල සංචාරයක් සිදු කරන ලදී. මේ සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගරු වියානි ගුණතිලක මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සකුනිකා ඩී සුගතපාල මහත්මිය, මණ්ඩලීය සභික වෛද්‍ය චම්පිකා වික්‍රමසිංහ මහත්මිය සහ නියෝජ්‍ය පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන් මහතා ද මේ අවස්ථාවට සහභාගී විය. එදින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති නීතිඥ ශාක්‍ය නානායක්කාර මහතා සමග මණ්ඩලයේ එක් එක් අංශයන්හි සිදුවන සේවාවන් පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී.









# ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් පුළුල් කිරීමේ ජාතික වැඩසටහන

# නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය

මතින් නිදහස් සුරක්ෂිත රටක් බිහි කිරීමේ ජාතික වැඩසටහන අනුව ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් පුළුල් කිරීමේ වැඩසටහනට ජාතික ආයතනය ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තම දායකත්වය සපයමින් සිටී.

ඒ යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නවදිගන්ත ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පරිශ්‍රයේ එකවර නේවාසිකයන් 1000කට ප්‍රතිකාර හා පුනරුත්ථාපන පහසුකම් ලබා දිය හැකි ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය පහත අරමුණු පෙරදැරි කර ගනිමින් ආරම්භ කරන ලදී.

- වැඩි සේවාලාභීන් පිරිසක් උදෙසා සාක්ෂි මත පදනම් වූ සහ ක්‍රමවේදීමය නේවාසික ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාදීම.
- එහිදී වර්තමානයේ පවතින ප්‍රබල ගැටලුවක් ලෙස හඳුනා ගෙන ඇති මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූවන් බන්ධනාගාර ගත කිරීමෙන් ඇති ව තිබෙන තදබදය අවම කිරීම.
- සෑම පුද්ගලයෙකුගේම ප්‍රතිකාර හා පුනරුත්ථාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම
- මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සහිත පුද්ගලයින් ඵලදායී ලෙස නැවත සමාජගත කිරීම සහ ජාතික ශ්‍රම බලකායට එක් කිරීම

උක්ත අරමුණු පෙරදැරි කර ගනිමින් පළමු අදියර යටතේ නේවාසික ප්‍රතිකාර ලබන්නන් 500 ක් සඳහා 2020.06.26 වන දින ව්‍යාපෘතියක් ලෙස මෙම වැඩසටහන ආරම්භ විය. නාවික හමුදාව විසින් මෙම ව්‍යාපෘතියෙහි සැලැස්ම් සකස් කළ අතර ශ්‍රම දායකත්වය ද ලබාදීම සිදු විය. මණ්ඩලයේ ඉල්ලීම මත එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන (UNODC) විසින් සහ ජර්මන් රජයෙහි ආධාර මත 2020.06.26 වන දින ප්‍රතිකාර ගොඩනැගිලි සංකීර්ණයේ එක් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමේ උත්සවය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.
ඓතිහාසික අත්තනගල්ල ශ්‍රී අරහන්ත රාජමහා විහාරාධිපති සීනාදි සිව්කෝරළයේ ප්‍රධාන සංඝනායක ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමියන් සිය පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් එක් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉදිරිපත් වූ අතර ඒ සඳහා මුල්ගල තැබීම 2020.08.26 වන දින සිදු කරන ලදී.

ඒ අනුව "පන්නිල ශ්‍රී ආනන්ද නාහිමි නේවාසිකාගාරය" නව ප්‍රතිකාර ගොඩනැගිල්ල 2021.01.29 වන දින ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලද අතර එහි මේ වන විට නේවාසික සේවාලාභීන් 60 ක් ප්‍රතිකාර සේවාවන් ලබමින් සිටී.





එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන UNODC විසින් සහ ජර්මන් රජයෙහි ආධාර මත නාවික හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් 2020.06.26 වන දින ඉදිවූ ප්‍රතිකාර ගොඩනැගිල්ලෙහි මේ වන විට වැඩ නිමකර අවසන් අතර මෙම ගොඩනැගිල්ල මාර්තු මස 30 වන දින මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වියානි ගුණතිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරනු ලැබීය. ඒ සඳහා UNODC ගෝලීය සමුද්‍ර අපරාධ වැඩසටහනෙහි ප්‍රධානී සිරි බොජුනේ මහත්මිය, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මාලිකා සූරියප්පෙරුම මහත්මිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතා, අධ්‍යක්ෂ ජනරාල් හද්‍රානි සේනානායක මහත්මිය ඇතුළු නිලධාරීන් රැසක් සහභාගී විය.

















## World Women's Day celebration on 08 March at NDDCB

**"ඇය දැයේ අභිමානයයි"** තේමාව යටතේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කාන්තා සැමරුම් දින වැඩසටහන 2023.03.09 වන දින මණ්ඩලයේ ගරු සභාපති නීතිඥ ශාක්‍ය නානායක්කාර මහතාගේ සහ අධ්‍යක්ෂ ජනරාල් භද්‍රානි සේනානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. ඒ සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සකුනිකා සුගතපාල මහත්මිය සහ කොළඹ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක අශෝක කුමාර මහතා සහභාගී වූ අතර සමාජ ආරක්ෂණ මණ්ඩලය, සුරාබදු දෙපාර්තමේන්තුව, වැලිකඩ පොලිස් ස්ථානය, කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සමෘද්ධි දෙපාර්තමේන්තුව, ඛණිජ වැලි සංස්ථාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජගිරිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, Child Action Lanka ආයතනය සහ රාජගිරිය, ඔබේසේකරපුර කාන්තා සංවිධානයන්හි සාමාජිකාවන් ඇතුලු කාන්තා නිලධාරීන් 200 ක් පමණ එම අවස්ථාවට සහභාගී විය.

"ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තාවන්ගේ භූමිකාව" පිළිබඳ ප්‍රධාන දේශනය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිතුමන් විසින් සිදු කරන ලදී.













දරුවන්
රටේ අනාගතයයි...




මත්ද්‍රව්‍ය වලින් නිදහස් වීමට කැමති නම්,
Long Term Effect of Heroin







## මෙතැම්පිටමින් භාවිත ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය සඳහා පොලිස් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළු පැවැත්වීම

මෙතැම්පිටමින් (අයිස්) භාවිත ව්‍යාප්තිය සම්බන්ධයෙන් සමස්ථ දිවයිනම ආවරණය කරමින් සිදු කරන සමීක්ෂණයේ දත්ත රැස් කිරීමේ කටයුතු පොලිස් දෙපාර්තමේන්තුවේ පූර්ණ සහයෝගය සහිතව ප්‍රජා පොලිස් ඒකකයේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මකවේ. සමීක්ෂණයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කරන ආකාරය පිළිබඳ ප්‍රජා පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම උදෙසා ඒ ඒ පළාත ආවරණය වන පරිදි පළාත් නවය සඳහා පුහුණු වැඩසටහන් සිදු කරන අතර මේ වන විට බස්නාහිර පළාත, ඌව පළාත, සබරගමුව පළාත, හා දකුණු පළාත තුළ මෙම පුහුණු වැඩසටහන් සිදු කර අවසන් කර තිබේ.

ඒ අනුව 2023.01.10 වන දින බස්නාහිර පළාතට අයත් සෑම පොලිස් ස්ථානයකටම අනියුක්ත ප්‍රජා පොලිස් නිලධාරීන් හා සම්පත්දායකයින් 140 දෙනෙකුගේ සහභාගීත්වයෙන් බස්නාහිර පළාත් නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පුහුණු වැඩසටහන සිදු කරන්නට යෙදුනි. 2023.03.17 වන දින දකුණු පළාතේ කොට්ඨාශ ප්‍රජා පොලිස් ස්ථානාධිපතිවරුන් කැඳවා ගාල්ල සහ මාතර යන ස්ථාන වලදී මෙම පුහුණු වැඩසටහන සිදු කරනු ලැබීය.

2023.03.30 වන දින වයඹ පළාතේ ප්‍රජා පොලිස් නිලධාරීන් සඳහා ද මෙම වැඩසටහන සිදු කළ අතර ප්‍රජා පොලිස් නිලධාරීන් 90 ගේ සහ සම්පත්දායකයින්ගේ දායකත්වයෙන් තෙවන අදියර යටතේ පුහුණු වැඩසටහන සිදු කරනු ලැබීය.2023.04.04 වන දින සබරගමු පළාත සඳහා වන පුහුණු වැඩසටහන රත්නපුර හා අවිස්සාවේල්ල යන ප්‍රදේශ දෙකම ආවරනය වන පරිදි සිදු කරනු ලැබීය. නිලධාරීන් හා සම්පත්දායකයින් 75 දෙනෙකු එම වැඩසටහන සඳහා සහභාගි විය. මීට අමතරව ඉතිරි පළාත් පහ තුළ ද සමීක්ෂණය සාර්ථකව සිදු කර ගැනීම උදෙසා එම පළාත් වලට අදාලව ප්‍රජා පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැළසුම් කර ඇත.

## ලෝක ළමා දිනයට සමගාමීව සිහින දකින අපේ ලොවක් පාසැල් පාදක සිතුවම් තරඟාවලිය – කුරුණෑගල





සිහින දකින අපේ ලොවක් යන තේමාව යටතේ 2022 ලෝක ළමා දිනයට සමගාමීව පාසැල් සිතුවම් තරඟාවලියක් පවත්වන ලදී. එය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිරසේවා අංශය සහ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒකාබද්ධව සංවිධානය කරන ලද අතර පාසැල් සිතුවම් තරඟාවලියේ ජයග්‍රාහී සිසු දරු දැරියන් සඳහා 2023.02.14 වන දින ත්‍යාග සහ සහතිකපත් ප්‍රධානය කරනු ලැබිණ. ඒ සඳහා කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ ඒ.ටී. දර්ශන මහතා, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල නිලධාරීන් මෙන්ම විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් සහ සිසු දරු දැරියන් රැසක් එයට සහභාගි විය.







# 75 වන නිදහස් දිනට සමගාමීව මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ............

2023.02.22 දින 75 වන නිදහස් දිනට සමගාමීව නාගරික ජනතාව මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා බලගැන්වීම අරමුණු කරගෙන බහු ආගමික,බහු ජාතික,මිශ්‍ර නගරයක් වූ මාවනැල්ල නගරය කේන්ද්‍ර කරගෙන මත්ද්‍රව්‍ය නිවාරණ ජංගම සේවාවක් ක්‍රියාත්මක විය. ඒ සඳහා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ ප්‍රාදේශීය ලේකම්තුමිය සහ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යක්ෂක ජෙනරාල් (රා.ආ) භද්‍රානි සේනානායක මහත්මිය සහ බාහිර සේවා නිලධාරිනියන්, ශ්‍රී ලංකා පොලිසිය, ජාතික ළමා රක්ෂණ අධිකාරි නිලධාරීන්, ප්‍රජා විශෝධන දෙපාතර්මේන්තුවේ දිස්ත්‍රික් නිලධාරීන්, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා හිමිකම් නිලධාරීන්, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ සංවධර්න නිලධාරීන්, අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයට අනුයුක්තව සේවය කරන සංවධර්න නිලධාරීන් සහ බහුකායර් නිලධාරීන් ඇතුලු රජය නිලධාරීන් පිරිසක් සහභාගිවිය.











# රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්

## Technical training programme on community based rehabilitation and community based drug prevention for the development officers of Colombo

Technical training programme on community based rehabilitation and community based drug prevention was held on 22nd February 2023 for the development officers of Colombo, Kalutara, Kandy and Kurunegala districts who are attached to the NDDCB. Healthy Lanka development institution has contributed to succeed the programme.75 development officers were participated for the training.









A training programme for Development officers of Jaffna district was held on 25th January. Officers from Alcohol and Drug information center (ADIC) participated as resource persons and NDDCB outreach officer of Jaffna district coordinated the programme.



## NDDCB Treatment Centers



### Kandy

"Kandy" Youth Prevention, Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa, Peradeniya
Tel : +94 81 2315504
Fax : +94 81 2315504
Email : methsevana@nddcb.gov.lk




### Nawadiganthaya

"Nawadiganthaya" Prevention, Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



### Talangama

"Talangama" Prevention, Treatment & Center
172, Shanthi Mawatha Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk



### Galle

"Galle" Prevention, Treatment & Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk